# බළන්ගොඩ නගර සභාව

## 2022-10-05 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.10.05**

**වේලාව - පෙ.ව. 10.30**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එස්.ඒ.ජෝර්ජ් මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනී | එම්.ජී. ශාන්තිලේඛා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රීනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ ධර්මරත්න මයා |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදි. 2022 නොවැම්බර් මස 01 වන දින සිට 2023 ඔක්තෝම්බර් මස 31 වන දින දක්වා වූ වර්ෂයක කාලයක් සඳහා බළන්ගොඩ නගරය පවිත්‍ර කිරීමේ සේවාව සඳහා කැඳවන ලද ටෙන්ඩර්පත් විවෘත කිරීම හා සුදුසු බඳුකරුවන් තෝරා ගැනීම මෙන්ම එකී වර්ෂයක කාලය සඳහා බළන්ගොඩ නගර සභාව සතු බළන්ගොඩ බස් නැවතුම්පොළ හා මහජන පොළ වැසිකිළි පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම, ගාස්තු අය කර පවත්වාගෙන යාම සඳහා කැඳවන ලද ටෙන්ඩර්පත් විවෘත කිරීම හා සුදුසු බඳුකරුවන් තෝරා ගැනීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බැවින් ඒ සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

ටෙන්ඩර් පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත සඳහන් තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

- බළන්ගොඩ නගර සභාව සතු බළන්ගොඩ බස් නැවතුම්පොළ හා මහජන පොළ වැසිකිළි පිරිසිදු කිරීම හා නඩත්තු කිරීම, ගාස්තු අය කර පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් පත් 04 ක් නිකුත් කර තිබූ අතර, එම ලංසුපත් හතරම ලැබී තිබුණි. එහිදී වැඩිම ලංසු මුදල වශයෙන් රුවන් කුට්ටියලාගේ ජයසුන්දර යන අය විසින් ඉදිරිපත් කර තිබූ රු. 221,500.00 ක මාසික ලංසු මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

- බළන්ගොඩ නගරය පවිත්‍ර කිරීමේ සේවාව සඳහා ටෙන්ඩර් පත් 05 නිකුත් කර තිබූ අතර, එම ලංසුපත් පහම ලැබී තිබුණි. එහිදී අවම ලංසු මුදල වශයෙන් ආර්.කේ.ජයසුන්දර යන අය විසින් ඉදිරිපත් කර තිබූ රු.585,000.00 ක මාසික ලංසු මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කළ නමුත් එම මුදලට අදාල සේවාව ඉටු කිරීමට නොහැකි බවත්, දෙවන අවම ලංසුව ඉදිරිපත් කර ඇති ටෙන්ඩර්කරුට ලබා දෙන ලෙසත් පවසා ඔහු විසින් ටෙන්ඩරය ලබා ගැනීම ප්‍රතික්ෂේප කරන ලදී. ඒ අනුව දෙවන අවම ලංසුව වන රු. 595,000.00 ක මුදල ඉදිරිපත් කළ හිරිකැටියේ රොමියෙල් යන අයට ලබා දීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කළ නමුත් ඔහු ද එම මුදලට අදාල සේවාව ඉටු කිරීමට නොහැකි බවත්, තෙවන අවම ලංසුව ඉදිරිපත් කර ඇති ටෙන්ඩර්කරුට ලබා දෙන ලෙසත් පවසා ටෙන්ඩරය ලබා ගැනීම ප්‍රතික්ෂේප කරන ලදී.

  ඒ අනුව තෙවන අවම ලංසු මුදල වන රු. 748,800.00 ක මාසික ලංසු මුදල හිරිකැටියේ රොෂාන් මධුසංක යන අය විසින් ඉදිරිපත් කර තිබූ අතර, එම රු. 748,800.00 ක මාසික ලංසු මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

  ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉහතින් ලබාගන්නා තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

  අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 11.12 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

  ඩබ්.ඒ වසන්ත ගුණරත්න,<br>
  සභාපති,බළන්ගොඩ නගර සභාව.